LOGS.LK

# තනතුරු - ඇබෑර්තු

## දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති බස්නාහිර පළාත් තුළ ස්ථිර පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව : - 02
2. වැටුප් පරිමාණය : - රා.ප.ච. 3/2016 අනුව රු. 24,250 - 250 x 10-270 x 10 - 300 x 10 -330 x 12 - රු. 36,410 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 II වැනි උපලේඛනය පරිදි වැටුප් ගෙවනු ලැබේ. iv වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.
3. අධ්‍යාපන සුදුසුකම් : - 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් ව තිබිය යුතුය.
4. කායික සුදුසුකම් : - තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
5. වයස් සීමාව : - අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය.
6. වෙනත් : -
   - I. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
   - II. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි.
   - III. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
   - IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතු ය.

7. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*
   - I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
   - II. වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට දායක විය යුතු ය.
   - III. පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් වන්නේය.
   - IV. මෙම බඳවා ගැනීම් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද රජය හෝ බස්නාහිර පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද අනුකූලය. ඒ අනුව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු වේ.

8. *බඳවා ගැනීමේ ක්‍රමය :*
   - I. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්, ලකුණු ලබා ගැනීම පහත පරිදි වේ.

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

II. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

- උප්පැන්න සහතිකය
- ජාතික හැඳුනුම්පත
- අධ්‍යාපන සහතික, ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික
- තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරිවරයාගේ සහතිකය
- මෑතක දී ලබා ගන්නා ලද චරිත සහතික 02 ක්
  (එක් චරිත සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි මහතාගෙන් ලබා ගත යුතුය. එය ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ යුතුය.
- වෘත්තීය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දැකවෙන සහතික
- දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතුය.
- මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

09. *අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.03.06 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ “ලේකම්, දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව, දොඩන්ගොඩ” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා අයදුම් කිරීම ලෙස සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

පී. ජී. පී. රුදිගෝ,<br>ලේකම්,<br>දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2018 ජනවාරි මස 30 වැනි දින,<br>දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව,<br>දොඩන්ගොඩ.

ආදර්ශ අයදුම් පත්‍රය

**බස්නාහිර පළාතේ රාජ්‍ය සේවයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම් පත්‍රය**

01. මුලකුරු සමග නම :———————————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :———————————————.
03. ස්ථිර ලිපිනය :———————————————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———————————————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :———————————————.
06. දුරකථන අංකය :———————————————.
07. උපන් දිනය වර්ෂය:————— මාසය:————— දිනය:—————
08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස
    අවුරුදු:————— මාස:————— දින:—————
09. විවාහක/අවිවාහක බව :———————————————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? යන වග :———————————————.
11. අධ්‍යාපන සුදුසුකම් (පිටපත් අමුණා එවිය යුතුය.)
12. වෙනත් සුදුසුකම් :———————————————.

13. ඔබ දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නම් -

I. දැනට දරන තනතුර :______________________________.

II. අදාළ ආයතනය :______________________________.

14. ඔබ සාපරාධී වරදක් සම්බන්ධව උසාවියකින් වරදකරුව කරනු ලැබ තිබේද ?:_______________

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බවද දන්වමි.

_______________,

අයදුම්කරුගේ අත්සන.

දිනය :_______________.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම ආයතනයේ ....................................ලෙස සේවය කරනු ලබන ........................................................ මහතා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු කාර්යාලීය ලිපි ලේඛන අනුව නිවැරදි වේ. මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :____________

තනතුර :____________

දිනය :____________